# බුදු සසුනේ චිරස්ථිතිය උදෙසා වළගම්බා රාජ්‍ය සමයෙහි සිදු කළ ත්‍රිපිටක ග්‍රන්ථාරූඪකරණය පිළිබඳ විමර්ශනයක්

ජේ. සුදර්මා ප්‍රේමසිරි[1]

## හැඳින්වීම

ලෝකයට අභිමානයෙන් යුතුව ඉදිරිපත් කළ හැකි අතිශය විශ්වාසදායක ත්‍රිපිටක බුද්ධ භාෂිතය හා දීපවංසය, මහාවංසය ආදියෙන් පැවත එන අඛණ්ඩ පුරාවෘත්ත සම්ප්‍රදායක් ශ්‍රී ලංකාව සතුව පවතී. මෙම ත්‍රිපිටක බුද්ධ භාෂිතය හා පුරාවෘත්ත සම්ප්‍රදාය පැවත එන්නේ බුද්ධ කාලයේ යැයි කිවහොත් එය අතිශයෝක්තියක් නොවේ. සමස්ත ඉතිහාසයේ අතිශය වැදගත්කමකින් යුතු ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ සිද්ධිය සිදු වූයේ මාතලේ අලු ලෙණේදීය. එදා සිට විවිධ අටුවා ටීකා හා පරිවාර සාහිත්‍යයත් පුස්කොළ පොත්වල ලියන ලද්දේ ත්‍රිපිටක බුද්ධ භාෂිතය හා ශාසන වංශයයි. එහෙයින් වර්තමාන සමස්ත ධර්ම ශාස්ත්‍ර සාහිත්‍යයේ නිජබිම මාතලේ අලු විහාරය යැයි කිවහොත් නිවැරදිය. ත්‍රිපිටක ග්‍රන්ථාරූඪයට මුල් වූ පසුබිම, බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා මෙයින් ලැබුණ දායකත්වය කෙබඳදැයි විමසා බැලීම මෙහි අරමුණ වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය මෙහි පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගැනුණි. මෙහිදී ඇතැම් ප්‍රාථමික මූලාශ්‍රය පරිහරණයේදී ඒ මූලාශ්‍රයෙහි එන තොරතුරු පිළිබඳව තුලනාත්මක අධ්‍යයනයක් කිරීමට ද සිදුවිය. අට්ඨ කතා, මහාවංසය, දීපවංසය, පූජාවලිය, නිකාය සංග්‍රහය ආදී ප්‍රාථමික මූලාශ්‍රයන් මෙන්ම අස්ගිරියේ තල්පත, ලංකාවේ බුදු සමයේ ඉතිහාසය, පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය යනාදි ද්විතීයික මූලාශ්‍රයන් ද යොදා ගැනුණි.

## අන්තර්තය

මාතලේ අලු ලෙණේදී සිදුවූ මේ ශ්‍රේෂ්ඨ ඓතිහාසික සිද්ධිය පිළිබඳව වංසකතාවේ සඳහන් වන්නේ සීමිත වූ තොරතුරු ප්‍රමාණයකි. ත්‍රිපිටකය ද එහි අට්ඨ කතා ද භික්ෂූහු මුඛ පරම්පරාවෙන් ගෙන ආහ. එසමයෙහි සත්ත්වයන්ගේ හානිය දැක රැස් වූ භික්ෂූහු ධර්මයෙහි චිරස්ථිතිය සඳහා එය පොත්වල ලියා තැබූහ. මේ සිද්ධිය සිදු වූ කාල වකවානුව පිළිබඳව පරස්පර විරෝධතා දක්නට ලැබේ. මහාවංශය බ්‍රාහ්මණ තිස්ස සාගතයක් ගැන සඳහන් නොකරන හෙයින් කලිකාලය යනුවෙන් අදහස් කරන ලද්දේ සාගත සමය යයි ස්ථිරව කිව නොහැකිය. එහෙත් එය තිය බමුණාගේ කැරැල්ල ගැන සඳහන් කරන හෙයින් වංසත්ථප්පකාසිනියෙහි කලිකාලය යනුවෙන් හැඳින්වූයේ ඒ කැරැල්ල පැවති කාල සමයෙහි යැයි අනුමාන

---

[1] සහකාර කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
jspsudarma@gmail.com

කළ හැකිය. අටුවා කතාවන්හි 'බ්‍රාහ්මණ තීය දුබ්භික්ෂ' යන්නම 'බ්‍රාහ්මණ තීය භය' යනුවෙන් ද සඳහන් කර ඇති බැවින් බ්‍රාහ්මණ තීය කැරැල්ල පැවති කාලයත් බ්‍රාහ්මණ තීය සාගතය පැවති කාලයත් එකක් ම සේ සලකා ඇති බව පෙනේ.

බ්‍රාහ්මණ තිස්සගේ කැරලි කෝලාහල නිසා මුලු රටම දොළොස් වසරක දිගු දුර්භික්ෂයකින් වෙළී ගිය අතර රට වැසියාට කැළෑ ගස්වල කොළ පොතු ආහාරයට ගනිමින් දිවි ගෙවා ගැනීමට සිදු විය. එසමයෙහිම ඉන්දීය අර්ධද්වීපයෙන් පැමිණි ආක්‍රමණිකයන් අගනුවර විනාශ කර දැමූ අතර ඒ සමගම සමාජීය හා සංස්කෘතික අගය ද සම්පූර්ණයෙන්ම විනාශ විය. මෙකල මහා සංඝ රත්නය විසිරී ගොස් තමතමනට සුරක්ෂිත ස්ථානවල ලැගුම් ගත්හ. ඔවුන් සැම දෙනාගේම පරමාධ්‍යාශය වූයේ තමන් විසින්ම පවරාගත් ඒකායන වගකීම වූයේ තමන් මුඛ පරම්පරාවෙන් රැගෙන ආ මහා ධර්මස්කන්ධය, සාහිත්‍යය, උරුමය මතු පරම්පරාවට ලබා දීම සඳහා ආරක්ෂා කරන්නේ කෙසේද? යන්නයි. මෙහිදී මහා සංඝරත්නයේ අදහස වූයේ අනාගතයේ ඇති වන එවන් විපත් සමයක් තුළ දී බුද්ධ දේශනාව ආරක්ෂා කර ගැනීමට යම්කිසි පියවරක් ගත යුතු බවය. බුද්ධ දේශනාව ලේඛනගත කර තැබීමේ බැරෑරුම් කර්තව්‍යයට අත ගැසුයේ මේ ආකාරයෙනි. අප සංස්කෘතික උරුමය ආරක්ෂා වූ රෝහණ දේශයේ වනගත ආරාම නොවන්නට මේ බැරෑරම් කර්තව්‍යය සාක්ෂාත් කර ගැනීමට නොහැකි මෙහෙවරක් වනු ඇත. විදේශ ආක්‍රමණ හමුවේ අනුරාධපුරයෙන් පලා ගිය බහුශ්‍රැත භික්ෂු පඬිරුවන් රැකවරණය පතා ගියේ මෙම ආශ්‍රම බලා ය.

වළගම්බා රාජ්‍ය සමය තුළ උද්ගත වූ දේශපාලන වාතාවරණය, සමාජීය තත්වය, ශාසනික වාතාවරණය මෙන්ම ආධ්‍යාත්මික වශයෙන් ඇති වූ බලපෑම ත්‍රිපිටක ග්‍රන්ථාරූඪයට මග පෑදූ නමුදු රාජ්‍ය අනුග්‍රහයක් මේ සඳහා ලැබුණ බවක් කිසිදු මූලාශ්‍රයක සඳහන් නොවේ. එවන් පසුබිමක භික්ෂුවගේ දායකත්වය අගය කළ යුත්තකි. ත්‍රිපිටක ග්‍රන්ථාරූඪය වනාහි ශාසන ඉතිහාසයේ කඩඉමකි. එය භික්ෂු ජීවිතයේ ද සැළකිය යුතු පෙරළියක් ඇති කළ ශාසනික කටයුත්තකි. සසුනේ චිරස්ථායි බව තහවුරු කර ගැනීමට ගන්නා ලද සාධනීය පියවරකි. එපමණක් නොව මිනිසාගේ විශිෂ්ටත්වය රඳා පවතින සංස්කෘතියෙහි එක් අංශයක් වූ භාෂා සාහිත්‍යයේ ද එක් සංධිස්ථානයකි. ත්‍රිපිටක ග්‍රන්ථාරූඪයට බලපෑ හේතු ඉදිරිපත් කරන ඊ.ඩබ්. අධිකාරම් මහතා මහා විහාරයෙන් වෙන් වූ පක්ෂයක් අභයගිරියෙහි ඇතිවීම එක් හේතුවක් වශයෙන් දක්වයි. චාල්ස් එලියට් මහතා දක්වන්නේ ග්‍රන්ථාරූඪය සිදු වූයේ මහා විහාරයට විපක්ෂව අභයගිරියෙහි ඇති වූ නිසා බව ද දක්වයි.

එමෙන්ම ග්‍රන්ථාරූඪයට පෙර මණ්ඩලාරාමයේ පැවැත්වූ ධර්ම සංවාදය මෙම ග්‍රන්ථාරූඪකරණයට පදනම දැමූ තවත් සාධකයක් වශයෙන් සැළකිය හැකිය. විභංග අට්ඨ කතාවේ එන සඳහනට අනුව මෙය සිදු ව ඇත්තේ බ්‍රාහ්මණ චෝර භය සංසිඳුවීමත් වළගම්බා රජු අනුරාධපුරයෙහි නැවත වරක් රාජ්‍යයත්වයට පත් වීමත් සමග බව පෙනේ. මෙම මණ්ඩලාරාම සම්මේලනයෙන් පසුව ග්‍රන්ථාරූඪය සිදු වූ බව සිතිය හැකිය. මන්ද යත් ඊට පළමු ග්‍රන්ථාරූඪ කිරීමක් සිදු වී තිබුණි නම් යළි කටපාඩම් සැසඳීමක් අවශ්‍යය නොවන හෙයිනි.

කෙසේ වෙතත් මෙයින් ථෙරවාදී ත්‍රිපිටකය ප්‍රථම වතාවට ක්‍රමවත්ව ලේඛණාරූඪ වීම, ලේඛණාත වීම හරහා මහා සාහිත්‍යය සම්ප්‍රදායයක් වර්ධනය වීම, භික්ෂු ජීවිතයේ සැලකිය යුතු වෙනස්කම් රැසක් සිදුවීම, ග්‍රන්ථ මූලික කරගත් ගුරු ශිෂ්‍ය අධ්‍යාපන ක්‍රමය වර්ධනය වීම මෙන්ම ත්‍රිපිටකයේ ස්ථාවර සංරක්ෂණයක් සිදුවීම යනාදි මහඟු ප්‍රතිඵල ගණනාවක් අප සමාජයට උරුම විය.

**ප්‍රතිඵල**

මෙහිදී ග්‍රන්ථාරූඪකරණයට මුල් වූ පසුබිම හා මෙයින් ශාසන චිරස්ථිතිය සඳහා ලැබුණ දායකත්වය පිළිබඳව අනාවරණය කර ගැනීමට හැකි විය.

**නිගමනය**

ශාසන ඉතිහාසය තුළ සංධිස්ථානයක් වශයෙන් සළකනු ලබන ත්‍රිපිටක ග්‍රන්ථාරූඪ කිරීමේ මහඟු කර්තව්‍යය බුදු දහමේ චිරස්ථිතිය උදෙසා ගත් වැදගත් වූ ක්‍රියාමාර්ගයක් වශයෙන් සැලකිය හැකිය. මේ සඳහා එකල පැවති දේශපාලන වාතාවරණයත්, සමාජ වාතාවරණයත්, ශාසනික පසුබිම මෙන් ම පාරසරික හා ආධ්‍යාත්මික පසුබිම ද හේතු සාධක වූ බව කිව හැකි අතර, බුදු දහමේ චිරස්ථිතිය සඳහා මෙයින් මහඟු පිටුබලයක් ලැබුණු බව නිගමනය කෙරිණ.

**ප්‍රමුඛ පද :** ත්‍රිපිටකය, වළගම්බා රාජ්‍ය සමය, ග්‍රන්ථාරූඪය, නියං සමය

**ආශ්‍රිත ග්‍රන්ථ**

කිරිඇල්ලේ, ඥාණවිමල හිමි, (සංස්:), 1970, දීපවංසය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

කිරිඇල්ලේ, ඥාණවිමල හිමි, (සංස්:). (1986). *පූජාවලිය.* කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

හික්කඩුවේ, ශ්‍රී සුමංගල හිමි., බටුවන්තුඩාවේ. (සංස්:). (2004). *මහාවංසය.* දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

වල්පොළ, රාහුල හිමි. (1966). *ලංකාවේ බුදු සමයේ ඉතිහාසය.* කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

රෝහණදීර මැන්දිස් (සංස්.) (1969). *අස්ගිරියේ තල්පත.* විද්‍යෝදය විශ්වවිද්‍යාල මුද්‍රණය.